සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

| | | |
|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව I<br>மனைப் பொருளியல் I<br>Home Economics I | 28 S I | 2019.08.22 / 0830 - 1030<br>පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.

※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.

**1.** නිර්මාණකරණයේ මූලිකාංගයක් හා මූලධර්මයක් පිළිවෙළින්,
(1) රිද්මය සහ වයනය වේ.
(2) හැඩය සහ සමානුපාතය වේ.
(3) ඒකමිතිය සහ රිද්මය වේ.
(4) අවධාරණය සහ වර්ණය වේ.
(5) වයනය සහ හැඩය වේ.

**2.** බාහිර සහ අභ්‍යන්තර අවකාශ නිර්මාණය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) උස බිත්ති සහිත කාමරයක අභ්‍යන්තර අවකාශයේ තැබීමට දිගින් සහ පළලින් වැඩි ගෘහභාණ්ඩ සුදුසු වේ.
(2) භූ දර්ශනයට ගැළපෙන ආකාරයට ගමන් කිරීමේ අවකාශ සකස් කිරීම සංසරණය ලෙස හැඳින්වෙයි.
(3) කාමරයකට ස්වාභාවික ආලෝකය ලබා ගැනීම සඳහා වහලයට පාරභාෂක වීදුරු යෙදීම වඩාත් යෝග්‍ය වේ.
(4) ගොඩනැගිලිවල බිත්ති සඳහා සිමෙන්ති ගල් භාවිත කිරීමෙන් ඇතුළත රත්වීම අඩු කර ගත හැකි වේ.
(5) බාහිර අවකාශ නිර්මාණයේ දී ශාක විවිධ හැඩවලට කප්පාදු කිරීමෙන් සුමට භූ දර්ශනයක් සකස් කර ගත හැකි ය.

**3.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කැබිනෙට්ටුවක් මත අසමාන වස්තු දෙකක් මධ්‍ය ලක්ෂ්‍යයේ සිට සමාන දුරකින් තැබීමෙන් සමමිතික තුලනය පෙන්වයි.
(2) ප්‍රාථමික වර්ණ දෙකක් විවිධ ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමෙන් ද්විතීයික වර්ණ සෑදේ.
(3) නිර්මාණයක, එකම ලක්ෂණය විවිධ ආකාරවලින් පෙන්නුම් කිරීම ආසාත්මක රිද්මයයි.
(4) උපාංගවල හැඩය, වර්ණය සහ වයනයෙහි එකඟතාව තුළින් ඒකමිතිය පෙන්වයි.
(5) කුඩා කාමරයක් තුළ ගෘහභාණ්ඩ කට්ටල දෙකක් එකිනෙකට ආසන්නව තැබීමෙන් සමානුපාතික බව පිළිබිඹු කරයි.

**4.** ගොඩනැගිලි සහ භූ දර්ශන නිර්මාණය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?
(1) නිර්මාණ ශිල්පියාගේ මනසෙහි ඇති මූලික නිර්මාණාත්මක අදහස සන්දර්භය ලෙස හඳුන්වයි.
(2) උපයෝගීතාව රැකගත හැකි ආකාරයට අභ්‍යන්තර අවකාශ නිර්මාණය කළ යුතු ය.
(3) නිර්මාණකරණයේ දී හැඩය, ප්‍රමාණය සහ උස පිළිබඳව අවධාරණය කළ යුතු ය.
(4) බාහිර අවකාශ නිර්මාණයේ දී දියඇලි සහ පොකුණු උපාංග ලෙස සලකනු ලබයි.
(5) වරිච්චි බිත්ති සහ පොල් අතු වහලය සහිත නිවාස ඉදිකිරීම, ශ්‍රී ලංකාවේ භූ දර්ශන නිර්මාණයේ ආරම්භය ලෙස සලකනු ලබයි.

**5.** කාබොහයිඩ්‍රේට දෙකක් අඩංගු කාණ්ඩය මින් කුමක් ද?
(1) මියුසින් සහ කොලැජන්
(2) කොලැජන් සහ ඉලාස්ටින්
(3) ලිග්නින් සහ පෙක්ටින්
(4) මියුසින් සහ ලිග්නින්
(5) ඉලාස්ටින් සහ පෙක්ටින්

[දෙවැනි පිටුව බලන්න.

**6.** අත්‍යාවශ්‍ය **නොවන** ඇමයිනෝ අම්ල දෙකක් වන්නේ,
(1) ත්‍රියොනීන් සහ ප්‍රෝලීන් ය.
(2) ලියුසීන් සහ ටයිරොසීන් ය.
(3) ඇලනීන් සහ හිස්ටිඩීන් ය.
(4) ආජිනීන් සහ වැලීන් ය.
(5) සිස්ටීන් සහ සෙරින් ය.

**7.** පහත සඳහන් මේද අම්ල අතුරෙන් ඔමේගා - 3 මේද අම්ලය වන්නේ,
(1) ලිනොලෙනික් අම්ලය ය.
(2) පාමිටික් අම්ලය ය.
(3) ඇරකිඩොනික් අම්ලය ය.
(4) ලිනොලෙයික් අම්ලය ය.
(5) ඔලෙයික් අම්ලය ය.

**8.** විටමින් B කාණ්ඩයට අයත් පිරිඩොක්සින් සහ ෆෝලික් අම්ලය හඳුන්වන්නේ පිළිවෙළින්,
(1) විටමින් $B_5$ සහ $B_7$ ලෙස ය.
(2) විටමින් $B_6$ සහ $B_7$ ලෙස ය.
(3) විටමින් $B_6$ සහ $B_9$ ලෙස ය.
(4) විටමින් $B_9$ සහ $B_{10}$ ලෙස ය.
(5) විටමින් $B_{10}$ සහ $B_{12}$ ලෙස ය.

**9.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ජලයෙහි කෘත්‍යයක් **නොවන්නේ** කුමක් ද?
(1) ශරීර උෂ්ණත්වය යාමනය කරයි.
(2) පෝෂ්‍ය පදාර්ථ ජීර්ණය සහ අවශෝෂණය සඳහා දායක වෙයි.
(3) සිරුරේ විද්‍යුත් විච්ඡේද්‍ය සමතුලිතතාව පවත්වා ගනියි.
(4) පටකවල ස්ථායීතාව පාලනය කරයි.
(5) සිරුරේ අතිරික්ත විටමින් E සහ K බැහැර කිරීම සඳහා ක්‍රියා කරයි.

**10.** ආහාර ද්‍රව්‍ය කිහිපයක පෝෂණ අගය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - කැල්සියම් සහ ෆොස්ෆරස් අඩංගු ය.
B - විටමින් A වලින් සරු ය.
C - විටමින් $B_2$ සහ $B_{12}$ අන්තර්ගත ය.
D - යකඩ බහුල ය.
E - විටමින් C වල මූලාශ්‍රයකි (Source).
මේවායින් කිරිවල පෝෂණ අගය දැක්වෙන ප්‍රකාශ වන්නේ,
(1) A සහ B ය. (2) B සහ E ය. (3) A, B සහ C ය. (4) A, C සහ D ය. (5) C, D සහ E ය.

**11.** ළදරුවන්ගේ ආමාශයේ ඇති ප්‍රෝටීන් ජීර්ණය කරන අක්‍රිය එන්සයිමය මින් කුමක් ද?
(1) පෙප්සිනෝජන්
(2) ප්‍රෝරෙනින්
(3) ට්‍රිප්සිනෝජන්
(4) රෙනින්
(5) පෙප්සින්

**12.** ආහාර ජීර්ණයේ දී ග්‍රහණිය තුළ සිදුවන ජීර්ණ ක්‍රියාවක් වන්නේ,
(1) පොලිපෙප්ටයිඩ, ඩයිපෙප්ටයිඩ බවට පත් කිරීමයි.
(2) ඩයිසැකරයිඩ, මොනොසැකරයිඩ බවට පත් කිරීමයි.
(3) ඩයිපෙප්ටයිඩ, ඇමයිනෝ අම්ල බවට පත් කිරීමයි.
(4) පිෂ්ටය, මොනොසැකරයිඩ බවට පත් කිරීමයි.
(5) ප්‍රෝටීන්, ප්‍රෝටියෝස සහ පෙප්ටෝන බවට පත් කිරීමයි.

More Past Papers at
tamilguru.lk

**13.** යකඩ ඌනතාවට හේතුවන කරුණක් **නොවන්නේ,**
(1) ෆයිටික් අම්ලය අඩංගු ආහාර පරිභෝජනය කිරීමයි.
(2) පරපෝෂිත ආසාදන තිබීමයි.
(3) ආහාරවේල්වලට ආසන්නව තේ පානය කිරීමයි.
(4) සිරුර විජලනයට පත්වීමයි.
(5) ආමාශයික තුවාල ඇතිවීමයි.

**14.** ජීවන චක්‍රය තුළ පෝෂක අවශ්‍යතාව වැඩි අවධි දෙකක් වන්නේ,
(1) ළදරු සහ වැඩිහිටි අවධිය ය.
(2) ළදරු සහ ක්ෂීරණ අවධිය ය.
(3) ළමා සහ නවයොවුන් අවධිය ය.
(4) ළමා සහ ගර්භිණී අවධිය ය.
(5) වැඩිහිටි සහ මහලු අවධිය ය.

15. පුද්ගලයකුගේ ශරීර බර පිළිබඳව දර්ශකයක් වන ඉන සහ උකුල අතර අනුපාතයෙහි කඩඉම් සීමා (cut-off) වන්නේ,
(1) පිරිමින්ගේ 0.8 සහ ස්ත්‍රීන්ගේ 0.9 ය.
(2) පිරිමින්ගේ 0.7 සහ ස්ත්‍රීන්ගේ 0.8 ය.
(3) පිරිමින්ගේ 0.8 සහ ස්ත්‍රීන්ගේ 0.7 ය.
(4) පිරිමින්ගේ 0.9 සහ ස්ත්‍රීන්ගේ 0.8 ය.
(5) පිරිමින්ගේ 0.7 සහ ස්ත්‍රීන්ගේ 0.6 ය.

16. ආමාශයික ප්‍රදාහය ඇති පුද්ගලයකු තුළ පැවතිය යුතු යහපත් ආහාර පුරුද්දක් වන්නේ,
(1) සීනි සහ පැණිරස ආහාර පාලනය කිරීමයි.
(2) තන්තුමය ආහාර අඩංගු කර ගැනීමයි.
(3) රාත්‍රී ආහාරවේල ප්‍රමාද කිරීමයි.
(4) කිරි පරිභෝජනය සීමා කිරීමයි.
(5) එක්වරකට අඩු ආහාර ප්‍රමාණයක් ගැනීමයි.

17. ආහාර පිසීමේ දී භාවිත කරන උකු කාරකයක් සහ මෘදු කාරකයක් පිළිවෙළින් අඩංගු වන වරණය තෝරන්න.
(1) සීනි සහ කුරුඳු
(2) පොල්කිරි සහ තක්කාලි
(3) හාල්පිටි සහ ඉඟුරු
(4) විනාකිරි සහ සියඹලා
(5) සුදුළූනු සහ ගොරකා

18. බිත්තරයක් පෝච් කිරීමේ දී (Poaching) තාපය සංක්‍රාමණය වන ක්‍රම/ක්‍රමය වන්නේ,
(1) සන්නයනය සහ සංවහනයයි.
(2) සංවහනය සහ විකිරණයයි.
(3) සන්නයනය සහ විකිරණයයි.
(4) සංවහනය පමණි.
(5) සන්නයනය පමණි.

19. ක්ෂුද්‍රජීවීන් මගින් ආහාර නරක්වීම කෙරෙහි බලපාන බාහිර සාධක දෙකක් වන්නේ,
(1) තෙතමනය සහ pH අගය ය.
(2) සාපේක්ෂ ආර්ද්‍රතාව සහ පෝෂක ද්‍රව්‍ය ප්‍රමාණය ය.
(3) වායුගෝලීය ඔක්සිජන් සහ සාපේක්ෂ ආර්ද්‍රතාව ය.
(4) වායුගෝලීය ඔක්සිජන් සහ pH අගය ය.
(5) තෙතමනය සහ පෝෂක ද්‍රව්‍ය ප්‍රමාණය ය.


20. තාප ප්‍රතිකාරය මගින් ආහාර පරිරක්ෂණය කිරීම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - ආහාරයේ අඩංගු ව්‍යාධිජනක ජීවීන් විනාශ කිරීම සහ ඇතැම් එන්සයිම නිශේධනය කිරීම පැස්ටරීකරණයේ අරමුණයි.
B - උපරිතාප ක්‍රමයේ දී (UHT) ඇසුරුම් කරන ලද ආහාරය 130°–150° C උෂ්ණත්වයක විනාඩි කිහිපයක් තබයි.
C - ශීතනයේ දී ක්ෂුද්‍රජීවී ක්‍රියා සම්පූර්ණයෙන් නිශේධනය නො වේ.
D - අධිශීතනයේ දී ජල ද්‍රාව්‍ය විටමින් සුරක්ෂිත වේ.
මේවායින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ D ය. (4) A, C සහ D ය. (5) B, C සහ D ය.

21. තනිනූලේ දම්වැල් මැස්ම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - බොත්තම් කාස මැසීමට සහ බොත්තම් ඇල්ලීමට යොදා ගනියි.
B - මැසීම සඳහා වක් වූ ඉඳිකටුවක් භාවිත කරයි.
C - පහසුවෙන් ගැලවී යන මැස්මකි.
D - මැස්ම අවසන් කිරීම සඳහා ආපසු මැස්ම කිහිපයක් මසයි.
මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) A සහ D ය. (4) B සහ C ය. (5) B සහ D ය.

22. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්, රෙදිපිළි විරංජනය කිරීම සඳහා භාවිත කරන ඔක්සිහාරක විරංජකයකි.
(2) චාම් වියමන සහිත රෙදි ශක්තිමත් බවින් අඩු වේ.
(3) නයිලෝන් කෙඳි නිෂ්පාදනයේ දී සෑදෙන ද්‍රාවණය, ද්‍රවායන කැටීම මගින් කෙඳි බවට පත් කරයි.
(4) හරස් ගෙතුම් ක්‍රමයට ගොතන ලද රෙදි දික් අතට ඇදීම වැඩි ය.
(5) ලෝම රෙදිවලට ක්ෂුද්‍රජීවීන්ගෙන් වැඩි හානි සිදු වේ.

23. ඇඟිලිවලින් කුඩුකල නොහැකි ගුලියක් ඉතිරි වන්නේ පහත සඳහන් කුමන රෙදි වර්ගය පිළිස්සීමේ දී ද?
(1) නයිලෝන්
(2) කපු
(3) සෙලියුලෝස් ඇසිටේට්
(4) ලෝම
(5) ඇස්බැස්ටෝස්

**24.**




ජටා වියමන සහ සැටින් වියමන පිළිවෙළින් දැක්වෙන රූපසටහන් වන්නේ,

(1) A සහ B ය.
(2) A සහ C ය.
(3) B සහ D ය.
(4) B සහ E ය.
(5) D සහ E ය.


**25.** රෙදිපිළි සේදීමේ දී හැකිලීම වැළැක්වීම සඳහා සිදු කරන ප්‍රතිකාරයක් වන්නේ,

(1) විරංජනයයි.
(2) සැන්ෆරීකරණයයි.
(3) ෆෙල්ට් කිරීමයි.
(4) මලහරණයයි.
(5) මසරීකරණයයි.

**26.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) අක්වක් අඟුලු මැස්ම යෙදීමේ දී රෙද්දෙහි මතුපිටින් සහ නොපිටින් මැස්ම එකිනෙකට වෙනස්ව දිස් වේ.
(2) නිමිඇඳුම් කර්මාන්තයේ දී රෙදි කැපීම සඳහා ඍජු හා පටි කැපුම් තල පමණක් භාවිත වේ.
(3) ටෙරලින් හා රෙයෝන් පුනර්ජනිත කෙඳි කාණ්ඩයට අයත් වේ.
(4) ඕවර්ලොක් මැස්ම භාවිත වන්නේ අද්දර නිම කිරීමේ ක්‍රමයක් ලෙස ය.
(5) ජලරෝධක නිමාව සහිත රෙදිවලින් නිම වූ ඇඳුම් සිරුරට සුවපහසුවක් ගෙන දෙයි.

**27.** මෙම රූපසටහනේ දැක්වෙන්නේ කෙඳි විශේෂයක හරස්කඩ ව්‍යුහයයි. මෙම කෙඳි විශේෂය වන්නේ,



(1) මසර කරන ලද කපු ය.
(2) පොලිඑස්ටර් ය.
(3) සේද ය.
(4) ලිනන් ය.
(5) රෙයෝන් ය.

**28.** සාය පතරොම නිර්මාණය හා මැසීම සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සාය පතරොම නිර්මාණය කිරීමේ දී ඉන සිට උකුල දක්වා උස සෙන්ටිමීටර 21.5 ලෙස සැලකේ.
(2) අංශය හැඩ කිරීම සඳහා උකුල මිනුමේ සිට සෙන්ටිමීටර 1ක් පහත් කළ යුතු ය.
(3) සායෙහි ඉදිරිපස පතරොමට ආර දෙකක් යොදනු ඇත.
(4) ඉන ආර මැසීමේ දී මැද නැමීම දෙසට හරවා මැසිය යුතු ය.
(5) සාය මැසීමේ දී පිටුපස විවරය සඳහා සෙන්ටිමීටර 1 ක මැහුම් වාසි තැබිය යුතු ය.

**29.** අන්තර්පුද්ගල සම්බන්ධතා ගොඩනැගීම සඳහා වඩාත් සුදුසු ගුණාංග වන්නේ,

(1) තරඟකාරීබව සහ ආකර්ශනය ය.
(2) ආකර්ශනය සහ සංකාසනය ය.
(3) සංකාසනය සහ නායකත්වය ය.
(4) නායකත්වය සහ ආකර්ශනය ය.
(5) තරඟකාරීබව සහ නායකත්වය ය.

**30.** වාචික සන්නිවේදනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) තහවුරු කර ගැනීමේ හැකියාව වැඩි වීම.
(2) ප්‍රතිචාර ලැබීම ප්‍රමාද වීම.
(3) නැවත නැවත අධ්‍යයනය කිරීමට පහසු වීම.
(4) අන්‍යයන්ගේ අවධානය යොමු කර ගත හැකි වීම.
(5) අපැහැදිලි අවස්ථා පැහැදිලි කර ගැනීමට පහසු වීම.

**31.** පුද්ගලයින් අතර සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී 'සංසිද්ධි කථිකාවත' යනු,

(1) පුද්ගලයින් අතර මූලික සංවාදය ගොඩනැගීමයි.
(2) පුද්ගල මතවාද ප්‍රකාශ කිරීමයි.
(3) අවධානයෙන් යුතුව අන්‍යයන්ට ඇහුම්කන් දීමයි.
(4) තම රුචිකත්වය අනුව සාකච්ඡා කිරීමයි.
(5) සාකච්ඡා මගින් ඵලදායි තීරණයකට එළඹීමයි.

[පස්වැනි පිටුව බලන්න.

**32.** සම්මුඛ පරීක්ෂණයක දී අසනු ලබන ප්‍රශ්න වර්ග තුනක් පහත දැක් වේ.
A - ආවෘත ප්‍රශ්න
B - විවෘත ප්‍රශ්න
C - වැඩ කිරීමට ඇති කැමැත්ත පරීක්ෂා කිරීමේ ප්‍රශ්න
ඉහත ප්‍රශ්න වර්ග අතුරෙන් සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

**33.** 'ප්‍රයාණ සංචරණය' ට අයත් ක්‍රියාකාරකමක් වන්නේ,
(1) වනෝද්‍යාන කරා යාම ය.
(2) ගොවිපොළ නැරඹීම ය.
(3) කඳු නැගීම ය.
(4) මුහුදු වෙරළේ ඇවිදීම ය.
(5) පූජනීය ස්ථාන වන්දනා කිරීම ය.

**34.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සංචරණය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) විවේක කාලය ගත කිරීමේ ප්‍රතිමෝදක ක්‍රියාකාරකමක් වේ.
(2) සුපුරුදු පරිසරයෙන් වෙනස් ස්ථානයකට විස්ථාපනය වේ.
(3) යම් පාරිතෝෂිකයක් ලැබීමේ අදහසින් තොරව කිසියම් ස්ථානයකට යාම වේ.
(4) ගත කරන උපරිම කාල සීමාව මාස 10කට නොඅඩු වේ.
(5) කිසියම් ස්ථානයක අවම වශයෙන් එක් රාත්‍රියක්වත් ගත කිරීම සිදු වේ.

**35.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් 'රාශිගත සංචරණය' පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) නවීන සංචරණ ධාරාවක් වේ.
(2) පරිසරයට අවම සෘණාත්මක බලපෑමක් ඇති වේ.
(3) ජනප්‍රිය සංචාරක ස්ථාන වෙත යොමු වෙයි.
(4) ගැඹුරින් අත්දැකීම් ලබාගත හැකි ය.
(5) ඉතා කුඩා කණ්ඩායම් ලෙස සංචරණය කරයි.

**36.** සලකා බලනු ලබන රටෙහි ආර්ථික බල ප්‍රදේශය තුළට අනේවාසික ආගන්තුකයින් සංචරණය වීම හඳුන්වන්නේ,
(1) බාහිර යොමුගත සංචරණය ලෙස ය.
(2) අභ්‍යන්තර සංචරණය ලෙස ය.
(3) අභ්‍යන්තර යොමුගත සංචරණය ලෙස ය.
(4) ජාතික සංචරණය ලෙස ය.
(5) දේශීය සංචරණය ලෙස ය.

**37.** ගෘහයට සැපයෙන සේවාවන් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ. මින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ජලයේ උෂ්ණත්වය හා pH අගය මැනීම, පරිභෝජනය සඳහා ජලයෙහි යෝග්‍යතාව පරීක්ෂා කිරීමට භාවිත කරන භෞතික පරීක්ෂණ දෙකකි.
(2) මුළුතැන්ගෙයි භාවිත වන දෙවුම් බේසම සඳහා ජලය සපයන නළයෙහි විෂ්කම්භය මිලිමීටර 25ක් විය යුතු ය.
(3) ශ්‍රී ලංකාවේ ජාතික විදුලි බල පද්ධතියෙහි එකලා විදුලිය 110V වේ.
(4) නිවසක භාවිත වන සුසංහිත විදුලි පහනක ආයු කාලය ප්‍රතිදීප්ත පහනකට වඩා වැඩි ය.
(5) විදුලි පරිභෝජනයේ දී විදුලි ඒකකයක් ලෙස සැලකෙන්නේ කිලෝවොට් එකකි.

**38.** ජල පරිහරණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ. මින් නිරවද්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) රෙදි සේදීමට යොදා ගත් ජලය පූතික ටැංකියකට බැහැර කළ යුතු ය.
(2) වැසි ජලයෙහි කඨිනත්වය නිසා රෙදි සේදීමේ ක්‍රියාවලියට යෝග්‍ය නො වේ.
(3) රෙදි සෝදන යන්ත්‍ර භාවිතයේ දී අඩු රෙදි ප්‍රමාණයක් යොදා ක්‍රියාත්මක කිරීම යහපත් පුරුද්දකි.
(4) ජලයෙහි වෙසෙන ඊ කෝලයි (E-coli) ප්‍රමාණය මැනීමෙන් පානය සඳහා එහි යෝග්‍යතාව තීරණය කර ගත හැකි වේ.
(5) මිනිස් හා සත්ත්ව මළ සමඟ ජලයට එක්වන ක්ෂුද්‍රජීවීන් නිසා මැලේරියාව සහ පිටගැස්ම ඇති විය හැකි ය.

[ හයවැනි පිටුව බලන්න.

**39.** විද්‍යුත් ශක්තිය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ. මින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) තාප හානිය වළක්වා ගැනීම සඳහා ගිල්වුම් තාපකයකට වඩා තාපන එලකය භාවිතය යෝග්‍ය වේ.
(2) විදුලි සැපයුමක විභව අන්තරය මනිනු ලබන්නේ වෝල්ට් (V) වලිනි.
(3) සන්නායකයක් තුළ ගලායන ඉලෙක්ට්‍රෝන ප්‍රමාණය මනිනු ලබන්නේ ඕම් වලිනි.
(4) සජීවී රැහැන තුළින් නිවසට සැපයෙන විදුලිය පළමුවෙන් සේවා විලායකය තුළින් ගමන් කරයි.
(5) සාගර තරංග, ජෛව ස්කන්ධ සහ ගල් අඟුරු පුනර්ජනනීය ශක්ති ප්‍රභව වේ.

**40.** ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ලබාදෙන ජල සැපයුම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - ශ්‍රී ලංකාවේ ජල පරිභෝජනය සඳහා අය ක්‍රම තුනක් භාවිත වේ.
B - ජල ඒකකයක් සඳහා රු. 160.00ක ප්‍රාග්ධන මෙහෙයුම් හා නඩත්තු වියදමක් මණ්ඩලය විසින් දරයි.
C - ජලයෙහි ක්‍රෝමියම්, ඊයම් වැනි මූලද්‍රව්‍ය අඩංගු වීම නිසා පානීය ජලය ලෙස භාවිත කිරීම නුසුදුසු වේ.
මින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි. (4) A සහ C පමණි. (5) B සහ C පමණි.

**41.** අවට පරිසරයට, හරිතාගාර වායු විමෝචනය අඩුවෙන් ම සිදුවන්නේ,
(1) පානීය ජල බෝතල් භාවිතයේ දී ය.
(2) ජෛව ඉන්ධන භාවිත කිරීමේ දී ය.
(3) සැකසූ ආහාර පරිභෝජනය කිරීමේ දී ය.
(4) උදුන්වලින් කහ දැල්ල නිකුත් වීමේ දී ය.
(5) ශීතකරණ භාවිත කිරීමේ දී ය.

**42.** 'හරිතාගාර ආවරණය' පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක් වේ.
A - රුක්රෝපණ වැඩසටහන් මගින් හරිතාගාර ආවරණය වේගවත් වේ.
B - ඉවැසි හරිතාගාර ආවරණය නිසා අයිස් කඳු (ග්ලැසියර්) දියවීම සිදු වේ.
C - හරිතාගාර ආවරණය නොමැති නම් පෘථිවි වායුගෝලයේ උෂ්ණත්වය -18 °C පමණ වේ.
D - වී වගාව හරිතාගාර ආවරණය අවම කරයි.
මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A සහ B පමණි. (2) B සහ C පමණි.
(3) A, B සහ C පමණි. (4) A, B සහ D පමණි.
(5) B, C සහ D පමණි.

**43.** ක්‍රියාකාරී ආහාරයක් සහ ඖෂධීය ආහාරයක් වන්නේ පිළිවෙළින්,
(1) තක්කාලි සහ සෝයා ය. (2) යෝගට් සහ ගොටුකොළ ය.
(3) ගොටුකොළ සහ නිවිති ය. (4) කැරට් සහ මුකුණුවැන්න ය.
(5) යෝගට් සහ තක්කාලි ය.

**44.** අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී භාවිත කරන පරිසර හිතකාමී ක්‍රමයක් **නොවන්නේ**,
(1) වෙන් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණයයි.
(2) කාබනික ද්‍රව්‍ය වියෝජනයෙන් කොම්පෝස්ට් සෑදීමයි.
(3) කාණු කපා සනද්‍රව්‍ය සුසංහිතව ඇසිරීමයි.
(4) වෙරළෙන් කිලෝමීටර 30ක් පමණ දුරින් මුහුදට මුදා හැරීමයි.
(5) ජීව වායුව නිපදවීමයි.

**45.** යොවුන්වියෙහි පසුවන ගැහැනු සහ පිරිමි දරුවන්ගේ කායික වර්ධනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යොවුන්වියෙහි ආරම්භය එකම වයස් සීමාවක් තුළ සිදු වෙයි.
(2) ස්වරාලය විශාල වීම දක්නට ලැබෙයි.
(3) ප්‍රජනක හෝමෝන ක්‍රියාකාරී වෙයි.
(4) පරිණත ප්‍රජනක සෛල ශරීරයේ ගබඩා කර තබයි.
(5) වයස අවුරුදු 17 දී ඇස්ට්‍රී මේරීම අවසන් වෙයි.

**46.** යොවුන් දරුවන්ගේ මානසික වර්ධනයේ දී පිළිබිඹු වන ලක්ෂණයක් වන්නේ,
(1) පුද්ගල කේන්ද්‍රීය බව ය.
(2) ඇසූ දුටු දෑ අනුවම සත්‍යය තීරණය කිරීම ය.
(3) සංයුක්ත චින්තනයට යොමු වීම ය.
(4) කාලය හා අවකාශය පිළිබඳ තේරුම් ගැනීමේ හැකියාව තිබීම ය.
(5) ප්‍රත්‍යාවර්තන හැකියාව ආරම්භ වීම ය.

**47.** යොවුන් දරුවන් සමාජයට යොමුවීමේ දී,

A - වැඩිහිටියන්ට අවනතව ක්‍රියා කරයි.

B - නායකත්වය ගැනීම ඉලක්ක කරයි.

C - සමාජයේ යහපත වෙනුවෙන් ක්‍රියා කිරීමට පෙළඹේ.

D - වගකීම් දැරීමට ඉදිරිපත් වේ.

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) C සහ D පමණි.
(4) A, B සහ C පමණි. (5) B, C සහ D පමණි.

**48.** 'ස්ව සංකල්පය' ගොඩනගා ගැනීමට දරුවන් යොමු කිරීමේ දී වැදගත් වන කරුණක් වන්නේ,

(1) දරුවන්ගේ එදිනෙදා වැඩකටයුතුවලට වැඩිහිටියන් මැදිහත් වීමයි.
(2) අනෙක් දරුවන්ගේ විවිධ හැකියා හා සංසන්දනය කිරීමයි.
(3) අභියෝග හා ගැටළු වැඩිහිටියන් විසින් විසඳීමයි.
(4) සුළු ජයග්‍රහණයක දී පවා දරුවන් ඇගයීමට ලක් කිරීමයි.
(5) දරුවන්ගේ දුර්වලතා අන් අය ඉදිරියේ පෙන්වා දීමයි.

**49.** ව්‍යවසායකත්වය පිළිබඳව සිසු පිරිසක් විසින් ඉදිරිපත් කළ අදහස් කිහිපයක් පහත දැක් වේ.

A - සේවා ලබාදීම ව්‍යවසායකත්වයට අයත් වේ.

B - අවදානම් දැරීමට යාම ව්‍යාපාරයට හානිකර වේ.

C - තරඟකාරී විශ්ලේෂණය ව්‍යාපාරයකට වැදගත් වේ.

D - ව්‍යාපාරයක සාර්ථකත්වය වැඩි ප්‍රාග්ධනයක් යෙදවීම මත රඳා පවතී.

මින් නිවැරදි අදහස් වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි. (4) B සහ D පමණි. (5) C සහ D පමණි.

**50.** ව්‍යාපාරයක ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා

(1) කළමනාකරණය, ව්‍යවසායකයා මගින් මධ්‍යගතව පවත්වා ගත යුතු ය.
(2) ව්‍යාපාරය තුළ දැඩි නීති රීති පැනවිය යුතු ය.
(3) කළමනාකරණ ක්‍රියාවලියෙහි පියවර අනුගමනය කළ යුතු ය.
(4) නව අත්හදා බැලීම් සම්පත් නාස්තියක් බව සැලකිය යුතු ය.
(5) දැන්වීම් ප්‍රචාරණය වඩාත් සාර්ථක ක්‍රමය ලෙස පිළිගත යුතු ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

2019.08.24 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

**1.** (i) වර්ණවල ගුණාංග **දෙකක්** නම් කර, ඒවා හඳුන්වන්න.

(ii) ගෘහීය විද්‍යුත් උපකරණයක් නම් කර එහි සිදුවන ශක්ති විපර්යාසය සඳහන් කරන්න.

(iii) ස්ථූලතාව ඇතිවීම සඳහා බලපාන ආහාරමය නොවන හේතු **දෙකක්** දක්වන්න.

(iv) දියවැඩියා රෝගයෙහි සංකූලතා **දෙකක්** සඳහන් කරන්න.

(v) ෆෙල්ට් කිරීම (felting) යනු කුමක් ද?

(vi) තිර රාමු මුද්‍රණය හඳුන්වන්න.

(vii) මානව පාලිත සංචාරක ආකර්ෂණය සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න.

(viii) 'ආහාර පා සළකුණු' (Food foot print) හඳුන්වන්න.

(ix) සන්නිවේදනයට ඇති බාධා **දෙකක්** සඳහන් කරන්න.

(x) දරුවකුගේ මානසික නීරෝගීතාව සඳහා බලපාන සාධක **දෙකක්** දක්වන්න.

(ලකුණු 02 × 10 යි)
(මුළු ලකුණු 20 යි)

**2.** (i) නිර්මාණකරණයේ මූලික සාධක **තුනක්** නම් කර, ඒවා හඳුන්වන්න. (ලකුණු 03 යි)

(ii) ගොඩනැගිල්ලක් ආලෝකකරණයේ දී සැලකිය යුතු කරුණු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iii) ගෘහ පරිසරයක ඇතුළත් උපාංග **තුනක්** නම් කර ඉන් **දෙකක** කෘත්‍ය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) අපජලය උත්පාදනය වන ප්‍රධාන මූලාශ්‍ර නම් කර ඒවායින් ජනනය වන අපද්‍රව්‍ය බැහැර කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

**3.** (i) බොජුන් පතක් සකස් කිරීමේ දී සැලකිය යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) අවුරුදු 1-5 තෙක් දරුවකුගේ විශේෂ පෝෂණ අවශ්‍යතා සඳහන් කර, ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත සඳහන් කරන ලද පෝෂක **දෙකක්** නිසි පරිදි නොලැබීමෙන් අවුරුදු 1-5 දරුවන් පිළිබිඹු කරන ඌනතා රෝග ලක්ෂණ වෙන් වෙන් ව දක්වන්න. (ලකුණු 04 යි)

(iv) වයස අවුරුදු හතරක දරුවකුගේ දිවා ආහාර වේල සඳහා බොජුන් පතක් සැලසුම් කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

[දෙවැනි පිටුව බලන්න.

**4.** (i) සුබීකරණය (බිලාන්වීකරණය) පරිරක්ෂණ ක්‍රමවල දී පූර්ව ප්‍රතිකාරයක් ලෙස යොදා ගනියි. සුබීකරණයෙහි වැදගත්කම සනාථ කිරීමට කරුණු **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

(ii) රසායනික පරිරක්ෂණකාරක භාවිත කිරීමේ දී නියමිත මාත්‍රාව පමණක් ආහාරයට එකතු කිරීම ඉතා වැදගත් ය. මෙම කාරක අධික ලෙස ශරීරගත වීම නිසා ඇතිවිය හැකි හානිකර තත්ත්ව මොනවා ද? (ලකුණු 03 යි)

(iii) ආහාර පරිරක්ෂණයේ දී යොදා ගන්නා යාන්ත්‍රික වියළීමෙහි විවිධ ක්‍රම විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iv) (*a*) ආහාර ඇසුරුමක තිබිය යුතු ගුණාංග සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(*b*) පරිරක්ෂිත ආහාර ඇසුරුම් කිරීමේ ව්‍යාපාරයක් ඇරඹීමට ප්‍රථම 'ශදුඅත' (SWOT) විශ්ලේෂණය සිදු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(මුළු ලකුණු 16 යි)

**5.** (i) වාණිජ මැහුම් ක්‍රමවල පෙනුම සහ කල්පැවැත්මට බලපාන සාධක **තුනක්** නම් කර ඒවා හඳුන්වන්න. (ලකුණු 03 යි)

(ii) ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයෙහි වැදගත්කම කරුණු **හතරක්** ඇසුරෙන් පහදන්න. (ලකුණු 04 යි)

(iii) මේස දරණුවක් මසා නිම කිරීම සඳහා බඳන වාටියක් (binding) යොදා ගන්නා අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) ඇඟලුම් කර්මාන්තයෙහි නිෂ්පාදන සඳහා 'පිරිසැලසුම' (product development) නිර්මාණය කරයි. පිරිසැලසුමෙහි ඇතුළත් පියවර විස්තර කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

**6.** (i) 'තිරසාර සම්පත් පරිභෝජනය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) තිරසාර සම්පත් පරිභෝජනයෙහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) සංචරණයේ ප්‍රභේද **හතරක්** නම් කර ඉන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) සංචරණයෙහි නිරත වන පුද්ගලයකුට අත්වන ප්‍රතිලාභ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(මුළු ලකුණු 16 යි)

**7.** (i) නව යොවුන් වියෙහි චිත්තවේග වර්ධනයේ ස්වභාවය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 03 යි)

(ii) නව යෞවනයා මුහුණදෙන පවුල හා සමාජය ආශ්‍රිත ගැටළු ඉදිරිපත් කරන්න. (ලකුණු 03 යි)

(iii) 'සමහර යොවුන් දරුවන් තුළ ඇතිවන මානසික පීඩනය (stress) කායිකව මෙන්ම චිත්තවේගීව පිළිබිඹු කරයි.' උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) යොවුන් දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා පාසලෙහි දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 16 යි)

**8.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව සටහන් ලියන්න.

(i) බාහිර අවකාශ නිර්මාණයේ දී උපාංග භාවිතය

(ii) දෛනික ආහාරවේල්වලට තන්තු ඇතුළත් කිරීමේ වැදගත්කම

(iii) නිම් ඇඳුම් සඳහා යොදනු ලබන නිමාවන්

(iv) සංචරණය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති වූ ධනාත්මක හා සෘණාත්මක බලපෑම්

(v) පුද්ගලයකුගේ පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන ජානමය ලක්ෂණ

(ලකුණු 04 × 4 යි)

(මුළු ලකුණු 16 යි)

* * *

More Past Papers at
tamilguru.lk